පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක-492

ආයතනයේ නම- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා

සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4)යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා

ගනු ලබන පියවර

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்றவெளியீட்டுதொடர் இலக்கம் - 492

நிறுவனத்தின் பெயர் : ஏற்றுமதிவிவசாயத் திணைக்களம்

பாராளுமன்றத்தில் அரசகணக்குகள் தொடர்பானசெயற்குழுவினால் முன்வைக்கப்பட்ட
அறிக்கை
தொடர்பாகநிலையானகட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவஅமைச்சரதுஅவதானிப்புக்கள்
மற்றும்
மேற்கொள்ளப்பட்டநடவடிக்கைகள்
பாராளுமன்றத்திற்குசமர்ப்பித்தல்.

Parliamentary Session No-492

Name Of the Institution- Department Of Export Agriculture

Presenting observations and actions taken regarding the report submitted to Parliament by the Committee on Public Accounts in terms of Standing Order No 119(4).

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492

ආයතනය- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පළමු කොටස -83

| වාර්තාවෙන් හදුනාගත් දුර්වලතා | දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය |
|---|---|
| • අවදානම් ලේඛන යාවත්කාලීනව පවත්වා නැත. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවදානම් ලේඛනය 2023 සිට පවත්වාගෙන යනු ලබන අතර එය අවශ්‍ය පරිදි යාවත්කාලීන කොට පවත්වාගෙන යනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| • විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුනි. | ජාතික විගණන කාර්යාලය මඟින් ඉදිරිපත් කරන විගණන විමසුම් සඳහා බොහෝ විට දිස්ත්‍රික් සහ උප කාර්යාල වලින් අදාල විස්තර ගෙන්වා ගෙන පිළිතුරු සැපයීමට සිදු වන බැවින් ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට මසකට වැඩි කාලයක් ගත වී ඇත.නමුත් මේ වන විට සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇති අතර ඉදිරියේදී මේ සම්බන්දයෙන් විශේෂ අවධානය යොමු කොට මසකට අඩු කාලයන් තුලදී නියමිත පරිදි විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට විශේෂ අවධානය යොමු කර කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| • අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වීම. | අභ්‍යන්තර විගණන කාර්යාලය මඟින් ඉදිරිපත් කරන විගණන විමසුම් සඳහා බොහෝ විට දිස්ත්‍රික් සහ උප කාර්යාල වලින් අදාල විස්තර ගෙන්වා ගෙන පිළිතුරු සැපයීමට සිදු වන බැවින් ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට මසකට වැඩි කාලයක් ගත වී ඇත.නමුත් මේ වන විට සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇති අතර ඉදිරියේදී මේ සම්බන්දයෙන් විශේෂ අවධානය යොමු කොට මසකට අඩු කාලයන් තුලදී නියමිත පරිදි විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| • වාහනයක් ගර්භිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කොට නොතිබුණි. | මේ වන විට අපහරණය කර ඇත. ඉදිරියේදී අදාළ කාල සීමාව තුළ ගර්භිත වාහන අපහරණය කිරීමට කටයුතු කරනු ලබන බව සඳහන් කර සිටිමි. |
| • බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | බැංකු ලැබීම් රිසිට්පත් නිවැරදිව හදුනාගත් පසු ඒවා උපලබ්ධි කලයුතු බැවින් දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක කාර්යාල වලින් ප්‍රමාද වී රිසිට්පත් ලැබීම නිසා ,නිසි වේලාවට බැංකු සැසඳුම ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.නමුත් ඉදිරියේදි එම තත්වය පිළිබඳ විශේෂ අවධානය යොමු කොට නියමිත දින හෝ ඊට පෙර දිනයේදී බැංකු සැසදුම් යොමු කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| • සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ පැවති ශේෂය අදාල චක්‍රලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය කොට නොතිබුණි. | භාණ්ඩාගාරයෙන් ලබා දුන් උපදෙස් අනුව 2023,2024,2025 යන වර්ෂ වලදී නියමිත දිනට පෙර අදාල මුදල් පියවීමට කටයුතු ඇති බව කාරුණිව දන්වා සිටිමි.<br>සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතෙහි ඇති ශේෂය අදාල භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 06/2020 හි සඳහන් පරිදි උප කාර්යාල සහිත අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් නිල බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාවට මුදල් භාරදී අදාල මුදල භාණ්ඩාගාරයට භාරදිය යුතු දිනයන් පහත පරිදි වන අතර ඒ අනුව නිසි ලෙස ගිණුම් පියවා ඇත. |

<table>
<tr><td></td><td>
<table>
<tr><th>ගිණුම් පියවන වර්ෂය</th><th>චක්‍රලේඛ ප්‍රකාරව පියවිය යුතු දිනය</th><th>ගිණුම පියවූ මුදල් / ප්‍රේෂණය කල දිනය</th></tr>
<tr><td>2023 වසරේ</td><td>ජනවාරි 04 හෝ එදිනට පෙර</td><td>2024-.01-04 දින</td></tr>
<tr><td>2024 වසරේ</td><td>ජනවාරි 04 හෝ එදිනට පෙර</td><td>2025-.01-01 දින</td></tr>
<tr><td>2025 වසරේ</td><td>ජනවාරි 04 හෝ එදිනට පෙර</td><td>2026-.01-02 දින</td></tr>
</table>
</td></tr>
<tr><td>• මූ.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්‍ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.</td><td>
2023,2024,2025 යන වර්ෂ සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල් ප්‍රමාණය,නියමිත දිනට පියවන ලද අත්තිකාරම මුදල් ප්‍රමාණය පහත දක්වා ඇති අතර ඉදිරියේදී නියමිත දිනට නොපියවන ලද අත්තිකාරම මුදල මෙහි ඇතුලත් අතර ඉදිරයේදී ලබා දෙනු ලබන තත්කාර්ය අතුරු අග්‍රිම නියමිත දින හෝ ඊට පෙර නිරවුල් කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.
<table>
<tr><th>වර්ෂය</th><th>ගෙවන ලද අත්තිකාරම මුදල් ප්‍රමාණය</th><th>නියමිත දිනට පියවන ලද අත්තිකාරම ප්‍රමාණය</th><th>නියමිත දිනට නොපියවන ලද අත්තිකාරම ප්‍රමාණය</th></tr>
<tr><td>2023</td><td>96</td><td>52</td><td>44</td></tr>
<tr><td>2024</td><td>85</td><td>41</td><td>44</td></tr>
<tr><td>2025</td><td>88</td><td>69</td><td>19</td></tr>
</table>
</td></tr>
<tr><td>• අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.</td><td>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PG/GT/2020(IIIවෙළුම) හා 2022.01.03 දිනැති ලිපියෙහි උපදෙස් පරිදි සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට සිදු විය.මේ වන විට නිලධාරීන් අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදී දෙපාර්තමේන්තුව සඳහා අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා නොගැනීමට කටයුතු කරන බව සඳහන් කර සිටිමි.</td></tr>
</table>

<table>
<tr>
<td>• සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්යමණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා වලින් ලබා දීඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.</td>
<td>අයවැය චක්‍රලේඛ 01/2023 අනුව 2023 වසර සඳහා වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන 6% කින් කපා හැරීම හා රජයේ වියදම් කළමනාකරණ යන චක්‍රලේඛයෙහි 6(ඇ) පරිදි පුහුණු අවස්ථා අඩු කිරීමට සිදු විය . ඉදිරියේදී සකස් කරන ලද මානව සම්පත් සැලැස්මට අනුව කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරන බව සඳහන් කර සිටිමි.</td>
</tr>
<tr>
<td>• විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.</td>
<td>විගණකාධිපති වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාරුණිකව දන්වා සටිමි.
<table>
<tr><th>නියෝගය</th><th>ලබාදුන් දිනය</th><th>නියෝගය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</th></tr>
<tr><td>1.බැංකු සසැඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.</td><td>2024.06.18</td><td>බැංකු ලැබීම් රිසිට්පත් නිවැරදිව හඳුනාගත් පසු ඒවා උපලබ්දි කල යුතු බැවින් දිස්ත්‍රික් කාර්යාල වලින් ප්‍රමාද වී රිසිට් ලැබීම නිසා නියි වේලාවට බැංකු සසැඳුම් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.නමුත් මේ වන විය ඉදිරිපත් කල යුතු සියදුම බැංකු සැසඳුම් ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී එම තත්වය පිළිබඳ විශේෂ අවධානය යොමු කොට නියමිත දින හෝ ඊට පෙර බැංකු සසැඳුම් යොමු කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.</td></tr>
</table>
</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| | 2.2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල මුර පද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි | 2024.06.18 | දෙපාර්තමේන්තුවේ වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය වන pay roll මෘදුකාංගයේ මුර පදය මේ වන විට171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව නිසි පරිදි තුන් මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | |
|---|---|
| • රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ /නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ හා නියොග සම්බන්ධයෙන් පහත පරිදි නිර්දේශ හා නියොග සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාර්ණිකව දන්වා සිටිමි. |

| නියෝගය | ලබාදුන් දිනය | නියෝගය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |
|---|---|---|
| 1. අපනයන ආදායම් ඉලක්ක ලඟාකර ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම. | 2024.06.18 | 2016 වර්ෂයේදී සකස් කරන ලද උක්ත සැලැස්මේ පැවති අඩුපාඩු හඳුනාගෙන එම අඩුපාඩු අවම වන පරිදි හා දේශීය හා විදේශීය වෙළඳපොල නව ප්‍රවණතා, ලෝක වෙළඳපොල ඉල්ලුම වැනි කරුණු පදනම් කරගෙන 2024 සිට 2030 හය අවුරුදු සැලැස්ම මේ වන විට සකස් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | 2.නිත්‍යානුකූල ලෙස වල්ලපට්ට වගාව ප්‍රවර්ධනය කිරීම හා අනෙකුත් සියළු බෝග අපනයනය සම්බන්ධයෙන් පවත්නා නීතිමය බාධා ඉවත් කිරීම. | 2024.06.18 | වල්ලපට්ට ශාකයේ නිත්‍යානුකූල කටයුතු කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරි ඇත. එය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබා ගැනීම සඳහා දැනට 1992 අංක 46 දරණ අපනයනය කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ පනතෙහි සංශෝධනය කෙටුම්පත නීතිපති මගින් අනුමත කරන ලදී.මෙම සංශෝධන කෙටුම්පත මේ වන විට කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුව පවතී.එසේම වල්ලපට්ට ශාඛය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන බවට කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ද මෙතෙක් දැනුම් දී නොමැත. |
| | 3.රජයට හා පෞද්ගලික අංශයට අයත් ඉඩම් කොටස් 29 ක් පවරා ගැනීමට කටයුතු නොකිරීම. | 2024.06.18 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ වෙනත් ආයතන සතු ඉඩම් කැබලි 18 ක් පවතින අතර ඉඩම් අත්කර ගැනීමෙ පනතට අනුව ඉන් ඉඩම් කැබලි 03 අත්පත් කරගැනීමේ ක්‍රියාවලියේ අවසන් අදියරේ පවතී. අනිකුත් ඉඩම් කැබලි අත්පත් කරගැනීම විවිධ අවස්ථා වල ක්‍රියාත්මක වෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | 4.වැබ් පරිගණක 300 ක් මිළදී ගැනීම සහ පරිගණක මෘදුකාංගයක් සකස් කිරීම සඳහා විශාල වියදමක් දරා තිබුණ ද එමගින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම. | 2024.06.18 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දැනට නිලධාරින් සතුව ඇති Tab පරිගණක මඟින් දත්ත පරිගණක ගත කිරීමටත් දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු, මාර්ගගත රැස්වීම්, දෙපාර්තමේන්තු දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රගති අධීක්ෂණ ආදී කටයුතු සඳහා භාවිතා කෙරේ. තවදුරටත් එහි උපයෝජනය වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.එසේම මේ වන විට අමාත්‍යාංශය හරහා මෙම පරිඝණක 300ය මිළදී ගැනීම සහ පරිඝණක මෘදුකාංගය සකස් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් ක්‍රියාත්මක කරනු ලබයි. |

| | |
|---|---|
| • සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | එම ප්‍රකාශය පිළිගනිමු. වර්තමානයේ ප්‍රකාශ ලබා ගැනීමට පූර්ව දැනුවත් කිරීම් සිදු කර ඇත. |
| • උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු නිලධාරි/සේවක ස්ථානමාරු, අනුමත වාර්ෂික ස්ථානමාරු පටිපාටියට අනුකූලව සිදු කර ඇත. එහෙත් අනුප්‍රාප්තිකයින් ලබාදීමේ ගැටළු හේතුවෙන් උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද සියළු නිලධාරීන් හට ස්ථානමාරු ලබා දීමට නොහැකිව ඇත. ඒකාබද්ධ සේවා නිලධාරී වාර්ෂික ස්ථානමාරු ක්‍රමවේදයට අනුව වසර 5ට වඩා වැඩි සියළු නිලධාරි/සේවක විස්තර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. |

එම්.කේ.එස්.ආර්.බී. සමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත
පේරාදෙණිය

එම්.කේ.එස්.ආර්.බී. සමරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්,

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අමාත්‍යාංශ ලේකම්,

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා

වාරිමාර්ග අමාත්‍යාංශය